**අධ්‍යාපන අමාත්‍යාංශය**

**2020 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය (2021 මාර්තු)**

# විෂය ප්‍රවර්ධන උපකාරක ප්‍රශ්න පත්‍රය

| බුද්ධ ධර්මය I,II | කාලය පැය තුන යි |
|---|---|

## බුද්ධ ධර්මය I

(1) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(3) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සසැඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(4) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

01. බුදු සිරිත අභියෝගවලින් ගහණ වූවකි. බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් පළමු අභියෝගය වන්නේ,

1. දස මරුන් පැරද වීමයි.
2. සත් සතිය ගත කිරීමයි.
3. මාර දූවරුන්ට මුහුණ දීමයි.
4. පළමු දම් දෙසුම පැවැත්වීමයි.

02. සත්ත්වයා මුහුණ දෙන සතර දුක් අතර **ව්‍යාධි දුක** යනු

1. ඉපදීම පිළිබඳ දුක වේ.
2. රෝදුක්වලට ගොදුරුවීම පිළිබඳ දුක වේ.
3. වයසට යාම පිළිබඳ දුක වේ.
4. මිය යාම පිළිබඳ දුක වේ.

03. සාංසාරික විමුක්තිය සලසා ගැනීමෙන් සියලු දුක් කෙළවර කරගත හැකි බව සිදුහත් කුමරුට අවබෝධ කර ගැනීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් වූයේ,

1. පංච මහා විලෝකනයයි.
2. රාහුල කුමාරෝත්පත්තියයි.
3. සරණ බන්ධනයයි.
4. සතර පෙර නිමිති දැකීමයි.

04. **අරඹව් ,නික්මෙව්, යෙදෙව් බුදු සසුන්හි. දිනව්, මරසෙන් පරදා බට කැළයට වැදි ඇතෙකු සේ.** මෙම අර්ථය සහිත ගාථාව ඇතුළත් සූත්‍ර දේශනාව නම්,

1. නිබ්බේධික සූත්‍රයයි.
2. පරිනිබ්බාන සූත්‍රයයි.
3. අරුණවතී සූත්‍රයයි.
4. සිගාලෝවාද සූත්‍රයයි.

05. සොරුන් අතින් ගිලිහී වැටී තිබුණු කහවණු පොදියක් අහුලා ගැනීම නිසා කරදරයකට පත් වීමට ගිය ගොවියෙකු බේරා ගැනීමෙන් බුදුරජාණන් වහන්සේගේ,

1. ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය ප්‍රකට වේ.
2. අසරණ සරණ ගුණය ප්‍රකට වේ.
3. පුරිස ධම්ම සාරථී ගුණය ප්‍රකට වේ
4. තාදී ගුණය ප්‍රකට වේ

06. උදය බමුණාගේ ආරාධනයෙන් බුදුරජාණන් වහන්සේ ඇතුලු ශ්‍රාවක පිරිස වේරංජා නුවර ගත කළේ,

1. පස්වන වස් කාලයයි.
2. හයවන වස් කාලයයි.
3. අටවන වස් කාලයයි.
4. දොළොස්වන වස් කාලයයි.

07. කායික හා වාචසික වශයෙන් අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකී යහපත් ක්‍රියාවන් හි යෙදීම

1. දානය නම් වේ.
2. අර්ථචර්යාව නම් වේ.
3. සීලය නම් වේ.
4. සමානාත්මතාව නම් වේ.

08. භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතාවක් **නොවන්නේ** මින් කුමක් ද?

1. යහපත් මිතුරු ඇසුර
2. කය වචනය දෙකෙහි අසංවර බව
3. නිතර ධර්මය ඇසීම
4. උත්සාහයෙන් කැපවීමෙන් ක්‍රියා කිරීම

09. සිදුහත් බෝසතාණෝ කිං කුසල ගවේශී ව සිටි කාලයේ හමුවූ සප්ත සමාපත්ති ලාභියෙකි,

1. සර්වමිත්‍ර බමුණා.
2. ආලාර කාලාම තවුසා.
3. භාර්ගව බමුණා.
4. උද්දකරාම පුත්ත තවුසා.

10. ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද, උතුම් වූ නිවනට සැපත් වූ හෙයින් ද, බුදුරජාණන් වහන්සේ

1. සුගත නම් වන සේක.
2. බුද්ධ නම් වන සේක.
3. ලෝකවිදූ නම් වන සේක.
4. භගවා නම් වන සේක.

11. විකෘතියකින් විපරීතයකින් තොර ව ප්‍රකෘතිය ප්‍රකෘතියක් ලෙස ම දැන දැක පසක් කරන එකී නුවණ ලැබීමට උපකාරී වන භාවනාව

1. සමාධි භාවනාව නම් වේ.
2. ප්‍රඥා භාවනාව නම් වේ.
3. චිත්ත භාවනාව නම් වේ.
4. මෛත්‍රී භාවනාව නම් වේ.

12. ද්‍රව්‍ය ලෝකයෙහි පවත්නා කිසියම් වස්තුවක පවතින ද්‍රව ස්වභාවය හැඳින්වීමට බුදුදහමේ භාවිත වචනය වන්නේ,

1. පඨවි යන්න ය.
2. තේජෝ යන්න ය.
3. ආපෝ යන්න ය.
4. වායෝ යන්න ය.

13. සිතෙහි වැනෙන සුලු ගතිය හෙවත් අතීරණාත්මක ස්වභාවය අර්ථවත් කෙරෙන නීවරණය ............ නමින් හඳුන්වයි.

1. ව්‍යාපාද 2. ථිනමිද්ධ 3. උද්දච්ච කුක්කුච්ච 4. විචිකිච්ඡා

14. තිලකුණු දන්නා තැනැත්තා තුළ ඇතිවන චරිත ලක්ෂණ අතරට අයත් **නොවන්නේ,**

1. ඉන්ද්‍රකීලයක් සේ දිවි ගෙවන්නේ ය.
2. උපේක්ෂා සහගත වන්නේ ය.
3. අටලෝ දහමින් කම්පිත වන්නේ ය.
4. අනතිමානී වන්නේ ය.

15. **මහණෙනි, ඔබට මවක නැත. පියෙකු නැත. එහෙයින් මෙබඳු අවස්ථාවක දී ඔවුනොවුන්ට උපකාරී ව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය.** මෙසේ වදාරමින් ගිලානෝපස්ථානය බුද්ධ පූජාවක් බවට පත් කිරීමට

ආසන්නතම හේතුව වන්නේ,

1. උදරාබාධයකින් පෙළුණු භික්ෂුවගේ කතා පුවත ය.
2. පූතිගත්ත තිස්ස තෙරුන් පිළිබඳ කතා පුවත ය.
3. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පිළිබඳ කතා පුවත ය.
4. මුගලන් මහ රහතන් වහන්සේ පිළිබඳ කතා පුවත ය.

16. බෝසතාණන් වහන්සේ........................... යන පාරමිතා පිරූ බවට පිළිවෙළින් මහාකපි, ලෝමහංස,වට්ටක යන ජාතක කතා නිදසුන් වේ.

1. සීල, නෙක්ඛම්ම, ප්‍රඥා
2. මෛත්‍රී, උපේක්ෂා, සත්‍ය
3. වීර්ය,ක්ෂාන්ති,අධිෂ්ඨාන
4. අධිෂ්ඨාන,දාන,වීර්ය

17. කුසල් යන්න හැඳින්වීමට යොදන පර්යාය පදයක් නොවන්නේ,

1. උදාසීන යන්න ය.
2. නිවැරදි යන්න ය.
3. නිරෝගී යන්න ය.
4. දක්ෂ යන්න ය.

18. සාමඤ්ඤඵල සූත්‍රෙය් දී කාමච්ඡන්ද නීවරණය උපමා කොට ඇත්තේ,

1. ණයගැතියෙකු ණය හිමියා කෙරෙහි ඇති බැඳීමට ය.
3. පිත්රෝගයෙන් පෙළෙන්නකුටය.
2. සිරගෙයක දුක් විඳින්නෙකුය.
4. වනයක අතරමං වූවෙකුටය.

19. සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයමින් රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් රචනා කළ ග්‍රන්ථය කුමක් ද?

1. පාරමිතා ප්‍රකරණය 2. පොහොය දිනය 3. බෞද්ධයාගේ අත්පොත 4. ධර්ම විනිශ්චය

20. බෞද්ධයාගේ අත්පොත නම් වූ ධම්මපදය ග්‍රන්ථය සූත්‍ර පිටකයේ ...................... අයත් වේ.

1. මජ්ඣිම නිකායට
2. අංගුත්තර නිකායට
3. සංයුත්ත නිකායට
4. ඛුද්දක නිකායට

21. සත්ත්වයාට නිදහසේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරන බැවින් බුදු දහම අවිහිංසාවාදී දහමකි. මෙය පංච ශීලයෙහි

1. පළමු ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.
2. දෙවන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.
3. තෙවන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.
4. සිව්වන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.

22. **වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ ජීවත් වන්නෙමු.** මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ පළමු පාදය ඇතුළත් පිළිතුර තෝරන්න.

1. සුසුඛං වත ජීවාම...
2. වාරිජෝව ථලේ ඛිත්තෝ......
3. යො වෙ වස්සසතං ජීවේ......
4. සුභානුපස්සිං විහරන්තං......



අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

23. නුවණින් පරීක්ෂා කර සිතා විමසා කටයුතු කිරීම,

1. සුචිකම්ම නම් වේ. 2. සඤ්ඤත නම් වේ. 3. නිසම්මකාරී නම් වේ. 4. ධම්මජීවී නම් වේ.

24. අභියෝගවලට මුහුණ දීමේ දී පාසල් සිසුවකු විසින් වර්ධනය **නොකළයුතු** චරිතාංගයකි,

1. නොසැලී ක්‍රියා කිරීම.
2. පක්ෂපාතී ව තීරණ ගැනීම.
3. විමසුම්ශීලී ව කටයුතු කිරීම.
4. උපායශීලී ව බුද්ධිමත් ව කටයුතු කිරීම.

25. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංසයක් **නොවන්නේ** මින් කුමක්ද ?

1. මහත් වූ හෝ සම්පත් අත්පත් කර ගැනීම
2. මරණින් මතු දුගතියෙහි උපත ලැබීම
3. සිහි මුළා නොවී කලුරිය කිරීම
4. ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹිය හැකි වීම

26. **සමගි වන්න. විවාද නොකරන්න.** මෙම අදහස ඇතුළත් පාලි පාඨය තෝරන්න.

1. සමවායෝ ඒව සාධු
2. සමග්ගා හෝථ මා විවදථ
3. සමග්ගානං තපෝ සුඛෝ
4. වේරිනේසු අවේරිනෝ

27. දැඩි චේතනාවකින් තොර ව සිදු කරනු ලබන අසම්පූර්ණ කුසලාකුසල කර්ම

1. ගරුක කර්ම නම් වේ.
2. ආසන්න කර්ම නම් වේ.
3. ආචිණ්ණ කර්ම නම් වේ.
4. කටත්තා කර්ම නම් වේ.

28. ක්‍රෝධය උපන් විට වෛරය උපදී. ක්‍රෝධය නිවීගිය විට වෛරය ද සංසිඳෙයි. මෙම ප්‍රකාශය අර්ථ ගැන්වෙන බුදු දහමේ මූලික ඉගැන්වීම වන්නේ,

1. පටිච්චසමුප්පාද ධර්මය යි.
2. චතුරාර්ය සත්‍ය ධර්මය යි.
3. ත්‍රිලක්ෂණ ධර්මය යි.
4. ආර්ය අෂ්ටාංගික මාර්ග ධර්මය යි.

29. මනා සිහි නුවණ ඇත්තෙකු සිය ධනය රැක ගනිමින් සාමකාමී දිවිපෙවෙතක් ගත කරයි. ඒ සඳහා පුද්ගලයාට මග පෙන්වන්නේ ගේහසික සීලයෙහි

1. දෙවන සිල් පදයෙනි.
2. තෙවන සිල් පදයෙනි.
3. සිව්වන සිල් පදයෙනි.
4. පස්වන සිල් පදයෙනි.

30. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව **උපාදාන** යනු,

1. සිතින් දැඩිව අල්ලා ගැනීමයි
2. ප්‍රතිසන්ධි සිත පහළ වීමයි
3. නැවත භවයට එක්වීමයි
4. කුසලාකුසල කර්ම රැස් කිරීමයි

31. මව්පියන් **බ්‍රහ්ම** නමින් හඳුන්වන්නේ ඔවුන් තුළ ................ යන සුවිශේෂී ගුණාංග පවතින නිසාවෙනි.

1. ජාති,ජරා, ව්‍යාධි, මරණ
2. පඨවි,ආපෝ,තේජෝ,වායෝ
3. සද්ධා,සීල,චාග,පඤ්ඤා
4. මෙත්තා,කරුණා,මුදිතා,උපෙක්ඛා



අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

32. කථාවත්ථුප්පකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම,

1. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි
2. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි
3. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි
4. සිව්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

33. අටලෝ දහමට අයත් අංගයක් ඇතුළත් **නොවන** පිළිතුර කුමක් ද?

1. වේදනා
2. නින්දා
3. අයස
4. අලාභ

34. **දකුණු අත උඩට නවා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ** නිරූපණය කෙරෙන්නේ,

1. ධ්‍යාන මුද්‍රාවයි
2. විතර්ක මුද්‍රාවයි
3. අභය මුද්‍රාවයි
4. ධර්මචක්‍ර මුද්‍රාවයි

35. නිවැරදි ධන පරිහරණයේ දී පංචබලි නම් යුතුකම් පහක් උගන්වන්නේ,

1. සිගාලෝවාද සූත්‍රයේ ය.
2. පත්තකම්ම සූත්‍රයේ ය.
3. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.
4. පරාභව සූත්‍රයේ ය.

36. සවන්දීමෙන් දියුණු කරගන්නා ප්‍රඥාව

1. චින්තාමය ප්‍රඥාවයි
2. භාවනාමය ප්‍රඥාවයි
3. සුතමය ප්‍රඥාවයි
4. උපාදානමය ප්‍රඥාවයි

37. **අනුන්ගේ සිත් දැන ගැනීමට ශක්තිය ඇති ඤාණය** හඳුන්වන නම කුමක්ද ?

1. පුබ්බේනිවාසානුස්සති ඤාණය
2. ආසවක්ඛය ඤාණය
3. පරචිත්ත විජානන ඤාණය
4. චුතූපපාත ඤාණය

38. තෙරුවන් කෙරෙහි කරුණු දැන ඇති කරගන්නා පැහැදීම ........................ නම් වේ.

1. සීලය
2. කරුණාව
3. උපේක්ෂාව
4. අවෙච්චප්පසාදය

39. ත්‍රි ශික්ෂාවට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග බෙදා දක් වූ කල්හි එහි සීල ශික්ෂාවේ ඇතුළත් **නොවන** මාර්ගාංගය වන්නේ,

1. සම්මා වායාමයයි
2. සම්මා ආජීවයයි
3. සම්මා කම්මන්තයයි
4. සම්මා වාචාවයි

40. **පරිසරය ආරක්ෂා කරන්නාට පරිසරයෙන් ආරක්ෂාව ලැබේ.** මෙම අදහස තහවුරු කෙරෙන බුද්ධ චරිතයේ සුවිශේෂී අවස්ථාවකි,

1. අනිමිස ලෝචන පූජාව.
2. රුවන් ගෙහි වැඩ සිටීම.
3. මුචලින්ද නා රජුගේ සෙවණ ලැබීම.
4. අජපාල නුගරුක මුල වැඩ සිටීම.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය